## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය - 2017

-----------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 09 දරන පනතින් සංශෝධිත 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 සැප්තැම්බර් 21 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතයයි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.115,394,076 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.14,683,781 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.154,202,781 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 139,519,000 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉඩම් සඳහා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය රු.151,320,000 ක් ඉකුත් වර්ෂයේ ආදායම තුල ඇතුළත් වීම ඉහත පිරිහීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අතිරික්තයක් පැවතිණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.68,837,107 ක් වූ දායකත්වය 2014 වර්ෂයේදී රු.74,018,254 දක්වා වර්ධනය වී 2015 වර්ෂයේ දී රු.73,390,333 ක් දක්වා අඩුවී තිබුණි. එසේවුවද 2016 වර්ෂයේදී රු.220,274,231ක වර්ධනයක් වූ අතර නැවත 2017 වර්ෂයේදී රු.72,997,491 ක් දක්වා අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 ඡේදය ප්‍රකාරව ආයතනයේ කටයුතු කෙටිකාලීන සහ දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කිරීමට අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැළැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත

ඉලක්ක කරා ළඟාවීමට හැකිවන පරිදි ආයතනය මෙහෙයවීම ආයතනයේ පූර්ණ වගකීම වූවද ආයතනය විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂයට අදාළව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ඉකුත් වර්ෂය තුළදී අවසන් කිරීමට නොහැකිවූ පර්යේෂණ ව්‍යාපෘති ඇතුළත් කර තිබූ අතර එම කාර්යභාරයන් ඉටුකිරීමට අපේක්ෂිත කාල වකවානු ක්‍රියාකාරී සැළැස්මේ ඇතුළත් කර නොතිබුණි. ඒ හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය මැනීමට නොහැකිවිය.

**4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතට අනුව පහත සඳහන් කාර්යයන් ඉටුකර නොතිබුණි.

(i) පනතේ 5(ඌ) ඡේදය අනුව ආයතනයේ පරමාර්ථවලට සමාන අරමුණු සහිත පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි පර්යේෂණ ආයතනය සමඟ සම්බන්ධ කමිටු පිහිටුවා පවත්වාගෙන යාම සහ ඒ ආයතනය සමඟ සහයෝගයෙන් හා ඒ සම්බන්ධව ක්‍රියා කිරීම පිණිස පහසුකම් සැලසීම.

(ii) පනතේ 12(1) වගන්තිය අනුව ආයතනයේ ආධාරය හා සහාය ඇතිව භාරගනු ලැබිය යුතු ප්‍රතිපත්ති අධ්‍යයන වැඩ පිළිවෙල සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම පිණිස පර්යේෂණ උපදේශක කමිටුවක් (Research Advisory committee) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කර නොතිබීම.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආයතනය විසින් පර්යේෂණ ව්‍යාපෘති 37 කින් රු.53,326,088 ක ආදායමක් උපයාගෙන තිබුණි. එසේවුවද ආයතනය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට පර්යේෂණ ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රගතිය දැක්වෙන කාර්යසාධන වාර්තාවක් සකස් කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ වැඩ අවසන් නොවූ පර්යේෂණ අංශ 05 කට අයත් වූ පර්යේෂණ ව්‍යාපෘති 14 ක් ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර තිබුණු අතර ඒ සඳහා රු.32,122,534 ක ආදායමක් ඇස්තමේන්තු ගත කර තිබුණි. එම පර්යේෂණ ව්‍යාපෘති 14 න් සමාලෝචිත වර්ෂය තුළදී පර්යේෂණ ව්‍යාපෘති 07 ක් අවසන් කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ වෙනත් පර්යේෂණ ව්‍යාපෘති 05 ක් සඳහා ප්‍රදානකරුවන්ගෙන් රු.13,592,237 ක අත්තිකාරම් මුදල් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම ව්‍යාපෘති නිම කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ ප්‍රකාශනයට පත්කළ පොත් වර්ග 11 ක් වෙනුවෙන් පොත් 3100 ක් මුද්‍රණය කිරීම සඳහා රු.818,400 ක් වියදම් කර තිබුණි. මින් පොත් 1662 ක් අලෙවියෙන් රු.505,393 ක ආදායමක් ලැබී තිබූ අතර වර්ෂය අවසානයට ප්‍රකාශන පොත් 1438 ක් ඉතිරිව පැවතුණි. ඒ අනුව අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගැනීමකින් තොරව පොත් මුද්‍රණය කිරීම නිසා වර්ෂය තුළ මුද්‍රණය කළ ප්‍රකාශන පොත් වලින් සියයට 46 ක ප්‍රමාණයක් අලෙවි කිරීමට හෝ බෙදා දීමට නොහැකිව ඉතිරිව තිබුණු අතර 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.1,246,995 ක් වටිනා පොත් 4005 ක් ප්‍රකාශන අංශයේ ඉතිරිව පැවතිණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

**6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**6.1 අභ්‍යන්තර විගණනය**

2009 ජූනි 09 දිනැති අංක DMA /2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 09 වන ඡේදය ප්‍රකාරව කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කර කළමනාකරණ හා විගණන කමිටුවේ සාකච්ඡාවට ඉදිරිපත් කළ යුතුය. කෙසේවුවද 2017 වර්ෂයේදී අභ්‍යන්තර විගණන වාර්තා චක්‍රලේඛයේ දක්වා ඇති ඉලක්ක ගත දිනයන්හිදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.

**6.2 ප්‍රසම්පාදන සැලැස්ම**

ආයතනය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද එය 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශයේ සඳහන් ආකෘතිය අනුව සකස් කර නොතිබුණි. එසේම කාල රාමුව නිර්ණය කිරීම සිදුකර නොතිබුණු අතර එම සැලැස්ම නිරතුරුවම අධීක්ෂණය කිරීමද සහ යාවත්කාලීන කිරීමද සිදුකර නොතිබුණි.

**6.3 අයවැය පාලනය**

අයවැයගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 6.6 සිට සියයට 102.2 දක්වා පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානය සඳහා යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම්හි ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර ප්‍රත්‍යාගණනය නොකිරීම. |
| (ආ) සැලසුම් සකස් කිරීම | සමාලෝචිත වර්ෂයට අදාලව සංයුක්ත සැළැස්මක් සකස්කර නොතිබීම හා ක්‍රියාකාරී සැලැස්ම කාලීනව ඇගයීමට ලක් නොකිරීම. |